(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 39.]

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

2022 නොවැම්බර් 23 බදාදා පූ.භා. 9.30 ට

පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රේමලාල් ජයසේකර මහතා,** වරාය හා ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෛයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු විමලවීර දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.

1. **ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ :** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2022 නොවැම්බර් මස 21 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

රනිල් වික්‍රමසිංහ
ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන : කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදනය කරන ලදී:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2022 නොවැම්බර් 23 දින ම'විසින් 'විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම: (1) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2014, 2015, 2017 සහ 2020 වර්ෂ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර එම වාර්තා, ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2023 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව විසින් ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ; සහ

(ii) 2023 කෙටුම්පත් ඇස්තමේන්තුවල පාඨ ආදියෙහි යෝජිත වෙනස් කිරීම් ලැයිස්තුව

ඉදිරිපත් කරන ලදී.

එම ලේඛන, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර එම වාර්තා, අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

4. කාරක සභා වාර්තා පිළිගැන්වීම: වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු රොෂාන් රණසිංහ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු ශශීන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2012 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(ii) 2013 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(iii) 2014 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(iv) 2015 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;

(v) 2016 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

5. මහජන පෙත්සම් පිළිගැන්වීම:

ආරච්චිකට්ටුව, පුත්තලම් පාර, ස්වර්ණ විලා යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. වසන්ත පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු 2022.11.15 දිනැති පෙත්සම ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

6. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 සහ 3 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7. විසර්ජන පනත් කෙටුම්පත — (අටවැනි වෙන් කළ දිනය): කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තියේ සිට 10 වැනි වගන්තිය දක්වා සලකා බැලීම පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි උපලේඛන සලකා බලා අවසාන වන තෙක් කල්තබන ලදී.

පළමුවැනි උපලේඛනය

පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්

ශීර්ෂය 1

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ඉදිරිපත් කළ යෝජනාව,— "වැඩසටහන රුපියල් 10/- කින් අඩු කළ යුතු ය".

(අ.භා.12.11 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු අසංක නවරත්න මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි ගරු බී.වයි. ජී.රත්නසේකර මහතා, ගරු ලලිත් එල්ලාවල මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා.1.31 ට ගරු අසංක නවරත්න මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.24 ට ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.29 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.55 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 6.19 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

ශීර්ෂය 1 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 2,794,350,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 1 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 487,800,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 1 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 500,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 2

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 2 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 925,700,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 2 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 86,300,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 4

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 4 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 383,500,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 4 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 13,500,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 5

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 5 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 178,300,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 5 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 85,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 6

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 6 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 308,840,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 6 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 13,100,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 7

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 7 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 102,620,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 7 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 800,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 8

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 8 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 148,700,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 8 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 4,700,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 9

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 9 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 33,700,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 9 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 300,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 10

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 10 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 781,560,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 10 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 28,800,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 11

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 11 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 110,400,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 11 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 3,300,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 13

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 13 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 282,300,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 13 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 2,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 16

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 16 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 3,695,950,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 16 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 120,200,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 17

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 17 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 69,850,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 17 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 700,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 18

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 18 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 159,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 18 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 1,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 19

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 19 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 215,500,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 19 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 19,700,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 20

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 20 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 10,903,660,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 20 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 86,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 21

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 21 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 2,457,430,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 21 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 21,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 22

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 22 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 54,280,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 22 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 300,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 25

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 25 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 17,300,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 25 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 100,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අනතුරුව සභාපති ප්‍රගතිය වාර්තා කළ යුතු යැයි ද, නැවත රැස්වීමට අවසර ගත යුතු යැයි ද අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2022 නොවැම්බර් 24 බ්‍රහස්පතින්දා .

8.පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම (අංක 1): පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 18 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:—

දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121ට ඉක්බිතිවම මතු සඳහන් ස්ථාවර නියෝග දෙක 122 සහ 123 වශයෙන් නව ස්ථාවර නියෝග දෙකක් ඇතුළත් කිරීම:—

122 නව ස්ථාවර නියෝගය,—

බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව

(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවට මතු සඳහන් බලතල තිබිය යුත්තේ ය:—

(අ) ශ්‍රී ලංකාවේ බැංකුකරණ, රක්ෂණ සහ වෙනත් මූල්‍ය ක්ෂේත්‍ර සේවාවන්හි වෘත්තීයමය ප්‍රමිතීන් සහ සංස්කෘතිය පිළිබඳව සලකා බලා වාර්තා කිරීමට;

(ආ) ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීම සහ බැංකුකරණ, රක්ෂණ සහ වෙනත් මූල්‍ය සේවා ආයතනවල ප්‍රමිතීන් ඉහල නැංවීම පිණිස ඒ මත දැඩි විනයක් ඇතිකිරීම සඳහා එම ආයතන වල ක්‍රියාකාරීත්වය සහ බහුවිධසේවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ ව්‍යවස්ථාදායක සහ අනෙකුත් නියාමන ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට;

(ඇ) ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්ති, විදේශීය මූල්‍ය සේවා නියෝග සහ ශ්‍රී ලංකාවේ මුදල් කටයුතු, ණය සහ මූල්‍ය සේවා සහ ආර්ථික වර්ධනය මත ඒවායේ බලපෑම් හා සම්බන්ධ කරුණු අංග සම්පූර්ණ පදනමකින් අධ්‍යයනය කොට සමාලෝචනය කිරීමට;

(ඈ) මහ බැංකු සංචිත පද්ධතිය, අපනයන හා විදේශීය වෙළඳ ප්‍රවර්ධනය, අපනයන පාලන ආනයන පාලන, වාණිජ, කර්මාන්ත සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, මූල්‍ය වෙළඳපොළ, මූල්‍ය ක්‍රියාවලි, මූල්‍ය ආයතනවල කාර්ය සාධනය සහ කළමනාකරණය, මුදල් නෝට්ටු, කාසි සහ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ නිදහස් කිරීම ඇතුලුව මුදල් ප්‍රතිපත්තිය හා සම්බන්ධ කරුණු සහ ණය වියපැහැදම් කිරීම සහ නැවත අය කර ගැනීම හා සම්බන්ධ කරුණු පිළිබඳව අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීමට සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරභාවය සහ අඛණ්ඩතාවය තහවුරු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට;

(ඉ) ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (Sri Lanka Inter Bank Offered Rate (SLIBOR)) සකස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නියාමන සහ තරඟකාරී විමර්ශන සිදුකිරීමට සහ ඒවා පරීක්ෂා කිරීමට;

(ඊ) රාජ්‍ය මූල්‍ය ආයතන සහ රක්ෂණය ඇතුළු සපයනු ලබන මූල්‍ය සේවාවන්ට අදාළ ආයතනික පාලනය, කාර්යසාධනය සහ කළමනාකරණය, විනිවිදභාවය මෙන්ම බැඳියාවන් අතර ගැටුම් සමාලෝචනය කිරීමට;

(උ) මූල්‍ය ප්‍රතිපත්ති සහ රක්ෂණය ඇතුළු මූල්‍ය ආයතනවලට අදාළව රජයේ සහ අනාගත රජයන්ගේ මෙන්ම පාර්ලිමේන්තුවේ වගකීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සමාලෝචන සිදු කිරීමට;

(ඌ) සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවේ කාර්යසාධනය හා කළමනාකරණය සහ ප්‍රාග්ධන වෙළඳපොළේ ප්‍රවණතාවන් පිළිබඳ විමසා වාර්තා කිරීමට; සහ

(එ) කොළඹ කොටස් වෙළඳපොළේ කාර්යසාධනය සහ කළමනාකරණය පිළිබඳ විමසා වාර්තා කිරීමට.

(3) රජය සතු යම් බැංකුවක් හෝ රක්ෂණය ඇතුළු මූල්‍ය සේවා සපයන වෙනත් ඕනෑම ආයතනයක් පිළිබඳ හෝ රජයේ ලිඛිත නීතියක් මඟින් බලය පවරා ඇති වෙනත් කාර්යයක් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයක් සහ ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව සිදු කරන විමර්ශනවලින් අනාවරණය වන තොරතුරු සම්බන්ධයෙන් කාරක සභාව සෑම තුන් මාසයකට වරක් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග අවශ්‍ය කරන කරුණු සම්බන්ධ නිරීක්ෂණ සහ යම් නිර්දේශයක් තිබේ නම් එම නිර්දේශ ද එකී වාර්තාවට ඇතුළත් විය යුත්තේ ය.

(4) කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් පසු එය මූල්‍ය විෂය භාර අමාත්‍යවරයාට සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කිරීමෙන් පසු සති අටක කාලසීමාවක් ඇතුළත එහි සඳහන් නිර්දේශ සපුරාලීමටත්, නිරීක්ෂණ සම්බන්ධයෙන් අනුගමනය කිරීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් සිදු කිරීමටත්, එම අමාත්‍යවරයන් විසින් ක්‍රියා කරනු ලැබිය යුතු අතර එසේ නොමැති නම් අදාළ නිර්දේශ සපුරාලීමක් සිදු නොකළ යුතු බවට අදාළ අමාත්‍යවරයා විශ්වාස කරන්නේ නම් ලිඛිතව ඊට හේතු දක්වා එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය කවරේ ද යන්නත් සඳහන් කරනු ලැබිය යුතු ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණාවලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(ආ) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනු කරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(6) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(7) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙකු ඕනෑම අවස්ථාවකදී කාරක සභාව ඉදිරියට කැඳවීමට, ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(8) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර අනුගාමී රැස්වීම් වාර තුනකට වඩා නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.

123 නව ස්ථාවර නියෝගය,—

ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව

(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ කාර්යයන් වන්නේ:—

(අ) රජය සතු ව්‍යවසායයවල කාර්ය සාධනය, කළමනාකරණය, මෙහෙයුම් කාර්යක්ෂමතාවය, ප්‍රතිපත්ති රාමුව, නෛතික රාමුව සහ අවදානම් කළමනාකරණය පරීක්ෂා කිරීම;

(ආ) රජය සතු ව්‍යවසායයවල මූල්‍ය ස්ථාවරත්වය, ණය කළමනාකරණය, ලාභ සහ ආයෝජන කළමනාකරණය පරීක්ෂා කිරීම;

(ඇ) රජය සතු ව්‍යවසායයවල පාඩු අවම කර ලාභ වැඩි කිරීම සඳහා අවසතුකරණය කිරීමේ අවශ්‍යතා, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව සඳහා ඇති අවස්ථා සහ උපායමාර්ග පරීක්ෂා කිරීම; සහ

(ඈ) රජය සතු ව්‍යවසායන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූවන්ට අදාළව මානව සම්පත් කළමනාකරණය, අධික හෝ අතිරික්ත කාර්ය මණ්ඩලය අඩු කිරීම, වේතන හා ව්‍යවස්ථාපිත ගෙවීම් නොගෙවීම සහ වේතන සහ දීමනා වැඩිපුර ගෙවීම පිළිබඳ පරීක්ෂා කිරීමය.

(3) 1971 අංක 38 දරන මුදල් පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනත මගින් පාලනය වන කවර හෝ රජය සතු ව්‍යවසායක් පිළිබඳව කාරක සභාව විසින් හෙළිදරව් කරගනු ලැබූ කරුණු සම්බන්ධයෙන් කාරක සභාව සෑම මාස තුනකටම වරක් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය.

(4) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ විට, එය මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කරනු ලැබිය යුතු අතර එම අමාත්‍යවරයන් විසින් වාර්තාවේ දක්වනු ලැබ ඇති නිර්දේශ සති අටක කාලසීමාවක් තුළ ඉටු කරනු ලැබීමටත්, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු යැයි එකී අමාත්‍යවරයන් විසින් යෝජනා කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබීමටත්, නැතහොත් යම් නිර්දේශයක් ඉටු නොකළ හැකිවනු ඇතැයි යන්න අදාළ අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් එයට ලිඛිතව හේතු පැහැදිලි කර එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කරනු ලැබීමටත් කටයුතු කරනු ලැබිය යුත්තේ ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(ආ) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනු කරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(6) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(7) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙකු අවස්ථාවකදී ඕනෑම පුද්ගලයෙක් කාරක සභාව ඉදිරියට කැඳවීමට, ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, ආර්ථික ස්ථායිකරණය පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(8) ආර්ථික ස්ථායිකරණය පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර කාරක සභා රැස්වීම් වාර තුනකට වඩා අඛණ්ඩව නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

''පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්,— පාර්ලිමේන්තුවේ, දැනට පවතින ස්ථාවර නියෝග 121 ට ඉක්බිතිවම අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 122 නව ස්ථාවර නියෝගය ඇතුළත් කිරීමට:—

''බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව

122. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවට මතු සඳහන් බලතල තිබිය යුත්තේ ය:—

(අ) ශ්‍රී ලංකාවේ බැංකුකරණ, රක්ෂණ සහ වෙනත් මූල්‍ය ක්ෂේත්‍ර සේවාවන්හි වෘත්තීයමය ප්‍රමිතීන් සහ සංස්කෘතිය පිළිබඳව සලකා බලා වාර්තා කිරීමට;

(ආ) ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීම සහ බැංකුකරණ, රක්ෂණ සහ වෙනත් මූල්‍ය සේවා ආයතනවල ප්‍රමිතීන් ඉහළ නැංවීම පිණිස ඒ මත දැඩි විනයක් ඇතිකිරීම සඳහා එම ආයතන වල ක්‍රියාකාරීත්වය සහ බහුවිධසේවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට සහ ව්‍යවස්ථාදායක සහ අනෙකුත් නියාමන ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට;

(ඇ) ජාත්‍යන්තර ආර්ථික ප්‍රතිපත්ති, විදේශීය මූල්‍ය සේවා නියෝග සහ ශ්‍රී ලංකාවේ මුදල් කටයුතු, ණය සහ මූල්‍ය සේවා සහ ආර්ථික වර්ධනය මත ඒවායේ බලපෑම් හා සම්බන්ධ කරුණු අංග සම්පූර්ණ පදනමකින් අධ්‍යයනය කොට සමාලෝචනය කිරීමට;

(ඈ) මහ බැංකු සංචිත පද්ධතිය, අපනයන හා විදේශීය වෙළඳ ප්‍රවර්ධනය, අපනයන පාලන ආනයන පාලන, වාණිජ, කර්මාන්ත සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, මූල්‍ය වෙළඳපොළ, මූල්‍ය ක්‍රියාවලි, මූල්‍ය ආයතනවල කාර්ය සාධනය සහ කළමනාකරණය, මුදල් නෝට්ටු, කාසි සහ ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සහ නිදහස් කිරීම ඇතුලුව මුදල් ප්‍රතිපත්තිය හා සම්බන්ධ කරුණු සහ ණය වියපැහැදම් කිරීම සහ නැවත අය කර ගැනීම හා සම්බන්ධ කරුණු පිළිබඳව අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීමට සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරභාවය සහ අඛණ්ඩතාවය තහවුරු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට;

(ඉ) ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (Sri Lanka Inter Bank Offered Rate (SLIBOR)) සකස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නියාමන සහ තරඟකාරී විමර්ශන සිදුකිරීමට සහ ඒවා පරීක්ෂා කිරීමට;

(ඊ) රාජ්‍ය මූල්‍ය ආයතන සහ රක්ෂණය ඇතුළු සපයනු ලබන මූල්‍ය සේවාවන්ට අදාළ ආයතනික පාලනය, කාර්යසාධනය සහ කළමනාකරණය, විනිවිදභාවය මෙන්ම බැඳියාවන් අතර ගැටුම් සමාලෝචනය කිරීමට;

(උ) මූල්‍ය ප්‍රතිපත්ති සහ රක්ෂණය ඇතුළු මූල්‍ය ආයතනවලට අදාළව රජයේ සහ අනාගත රජයන්ගේ මෙන්ම පාර්ලිමේන්තුවේ වගකීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සමාලෝචන සිදු කිරීමට;

(ඌ) සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවේ කාර්යසාධනය හා කළමනාකරණය සහ ප්‍රාග්ධන වෙළඳපොළේ ප්‍රවණතාවන් පිළිබඳ විමසා වාර්තා කිරීමට; සහ

(එ) කොළඹ කොටස් වෙළඳපොළේ කාර්යසාධනය සහ කළමනාකරණය පිළිබඳ විමසා වාර්තා කිරීමට.

(3) රජය සතු යම් බැංකුවක් හෝ රක්ෂණය ඇතුළු මූල්‍ය සේවා සපයන වෙනත් ඕනෑම ආයතනයක් පිළිබඳ හෝ රජයේ ලිඛිත නීතියක් මඟින් බලය පවරා ඇති වෙනත් කාර්යයක් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනයක් සහ ඉන් පැන නගින ඕනෑම කරුණක් පිළිබඳව සිදු කරන විමර්ශනවලින් අනාවරණය වන තොරතුරු සම්බන්ධයෙන් කාරක සභාව සෑම තුන් මාසයකට වරක් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය. ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග අවශ්‍ය කරන කරුණු සම්බන්ධ නිරීක්ෂණ සහ යම් නිර්දේශයක් තිබේ නම් එම නිර්දේශ ද එකී වාර්තාවට ඇතුළත් විය යුත්තේ ය.

(4) කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් පසු එය මූල්‍ය විෂය භාර අමාත්‍යවරයාට සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කිරීමෙන් පසු සති අටක කාලසීමාවක් ඇතුළත එහි සඳහන් නිර්දේශ සපුරාලීමටත්, නිරීක්ෂණ සම්බන්ධයෙන් අනුගමනය කිරීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් සිදු කිරීමටත්, එම අමාත්‍යවරයන් විසින් ක්‍රියා කරනු ලැබිය යුතු අතර එසේ නොමැති නම් අදාළ නිර්දේශ සපුරාලීමක් සිදු නොකළ යුතු බවට අදාළ අමාත්‍යවරයා විශ්වාස කරන්නේ නම් ලිඛිතව ඊට හේතු දක්වා එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය කවරේ ද යන්නත් සඳහන් කරනු ලැබිය යුතු ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණාවලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(ආ) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනු කරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(6) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(7) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙකු ඕනෑම අවස්ථාවකදී කාරක සභාව ඉදිරියට කැඳවීමට, ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(8) බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර අනුගාමී රැස්වීම් වාර තුනකට වඩා නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.''

'' සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''නව ස්ථාවර නියෝග, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට ඇතුළත් කළ යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්,— ඉහත පරිදි ඇතුළත් කරන ලද පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 122 ට ඉක්බිතිවම අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 123 නව ස්ථාවර නියෝගය ඇතුළත් කිරීමට:—

''ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව

(1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ කාර්යයන් වන්නේ:—

(අ) රජය සතු ව්‍යවසායවල කාර්ය සාධනය, කළමනාකරණය, මෙහෙයුම් කාර්යක්ෂමතාවය, ප්‍රතිපත්ති රාමුව, නෛතික රාමුව සහ අවදානම් කළමනාකරණය පරීක්ෂා කිරීම;

(ආ) රජය සතු ව්‍යවසායවල මූල්‍ය ස්ථාවරත්වය, ණය කළමනාකරණය, ලාභ සහ ආයෝජන කළමනාකරණය පරීක්ෂා කිරීම;

(ඇ) රජය සතු ව්‍යවසායවල පාඩු අවම කර ලාභ වැඩි කිරීම සඳහා අවසතුකරණය කිරීමේ අවශ්‍යතා, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව සඳහා ඇති අවස්ථා සහ උපායමාර්ග පරීක්ෂා කිරීම; සහ

(ඈ) රජය සතු ව්‍යවසායන් විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූවන්ට අදාළව මානව සම්පත් කළමනාකරණය, අධික හෝ අතිරික්ත කාර්ය මණ්ඩලය අඩු කිරීම, වේතන හා ව්‍යවස්ථාපිත ගෙවීම් නොගෙවීම සහ වේතන සහ දීමනා වැඩිපුර ගෙවීම පිළිබඳ පරීක්ෂා කිරීමය.

(3) 1971 අංක 38 දරන මුදල් පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනත මගින් පාලනය වන කවර හෝ රජය සතු ව්‍යවසායක් පිළිබඳව කාරක සභාව විසින් හෙළිදරව් කරගනු ලැබූ කරුණු සම්බන්ධයෙන් කාරක සභාව සෑම මාස තුනකටම වරක් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය.

(4) ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ විට, එය මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කරනු ලැබිය යුතු අතර එම අමාත්‍යවරයන් විසින් වාර්තාවේ දක්වනු ලැබ ඇති නිර්දේශ සති අටක කාලසීමාවක් තුළ ඉටු කරනු ලැබීමටත්, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු යැයි එකී අමාත්‍යවරයන් විසින් යෝජනා කරනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබීමටත්, නැතහොත් යම් නිර්දේශයක් ඉටු නොකළ හැකිවනු ඇතැයි යන්න අදාළ අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් එයට ලිඛිතව හේතු පැහැදිලි කර එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය සඳහන් කරනු ලැබීමටත් කටයුතු කරනු ලැබිය යුත්තේ ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(5) (අ) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(ආ) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනු කරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(6) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(7) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙකු අවස්ථාවකදී ඕනෑම පුද්ගලයෙක් කාරක සභාව ඉදිරියට කැඳවීමට, ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, ආර්ථික ස්ථායිකරණය පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(8) ආර්ථික ස්ථායිකරණය පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර කාරක සභා රැස්වීම් වාර තුනකට වඩා අඛණ්ඩව නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''නව ස්ථාවර නියෝගය, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට ඇතුළත් කළ යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තුව යළි එක්රැස් විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 122 සහ 123 කාරක සභාවේ දී සලකා බලා සම්මත කරන ලද බව වාර්තා කරන ලදී.

9.පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම (අංක 2): පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 21 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:—

යෝජිත, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 123ට ඉක්බිතිවම මතු සඳහන් නව ස්ථාවර නියෝගය 124 වශයෙන් ඇතුළත් කිරීම:—

124 නව ස්ථාවර නියෝගය,—

ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව

(1) රටේ ආර්ථික ස්ථායිබව ශක්තිමත් කිරීමේ දී රජයට අමතර ආදායම් රැස් කිරීම සඳහාත්, රජයේ වියදම් සලකා බැලීම සඳහාත්, ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම පිණිස තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත වන ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) රජය වෙනුවෙන් බදුකරණය, තීරු ගාස්තු හා අනෙකුත් ආදායම් වර්ධනය කිරීම සම්බන්ධ සියලුම කරුණු පරීක්ෂා කර බැලීමටත්, අවශ්‍ය පරිදි හා අවශ්‍ය අවස්ථාවන්හිදී බදු හා

තීරු ගාස්තු පිළිබඳව පවත්නා ප්‍රතිපත්තිවලට වෙනස්කම් යෝජනා කිරීමටත්, මෙම කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(3) ස්වකීය රාජකාරි ඉටුකිරීමෙහිලා කාරක සභාව මතු සඳහන් කරුණු පිළිබඳව විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කළ යුත්තේ ය:—

(අ) සඵලදායී ආදායම් රැස්කිරීමේ යාන්ත්‍රණ;

(ආ) දේශීය ආදායම් නීති සම්බන්ධ හා වෙනත් නීතිවල නියම කරනු ලැබ ඇති ආදායම් ක්‍රියාමාර්ග සම්බන්ධ කාරණා;

(ඇ) තීරු ගාස්තු, රේගු නීති සහ ආනයනවලට හා අපනයනවලට අදාළ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ ද ඇතුළත් වන, රේගුව හා රේගු පරිපාලනය ආශ්‍රිත කාරණා;

(ඈ) සියලුම ආකාරයේ වෙළඳ ගිවිසුම්, වෙළඳ භාණ්ඩ ගිවිසුම් හා ඒවා ක්‍රියාත්මක කරනු ලබන ආකාරය මෙන්ම එම ගිවිසුම්වල ජාත්‍යන්තර රීති හා පිළිගත් ලක්ෂණ ඇතුළු අන්තර් ජාතික වෙළඳාම ආශ්‍රිත කාරණා;

(ඉ) ආනයන කර්මාන්තයේ බලපෑම්, ආනයන ප්‍රතිපත්ති, තරගකාරී ආනයන වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රණයන් සහ හානිකර හා අසාධාරණ ආනයන හා එබඳු ආනයන පිළිවෙත් ආමන්ත්‍රණය කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළු ආනයන කර්මාන්තය ආශ්‍රිත කාරණා;

(ඊ) අපනයන ප්‍රතිපත්ති, අපනයන ප්‍රවර්ධන යාන්ත්‍රණ, වෙළඳපොළ ප්‍රවිෂ්ටය හා තරගකාරිත්වය, කර්මාන්තවලට අවශ්‍ය ද්‍රව්‍යවල අඛණ්ඩ සැපයුම, ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික වෙළඳ සබඳතා ඇතුළු වෙළඳ කර්මාන්තය ආශ්‍රිත විශේෂිත කාරණා;

(උ) සියලුම රජයේ විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය-උපස්ථානය, සුභසාධනය හා සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම, ඒවායේ ගෙවීම් හා ප්‍රතිපත්ති, රජයේ ළමා ආරක්ෂණ වැඩසටහන්, ශාරීරික හෝ මානසික ආබාධිතතා සහිත තැනැත්තන් සඳහා වන වැඩසටහන් සහ පුනරුත්ථාපන වැඩසටහන් ඇතුළු රජයේ සමාජ සේවා වැඩසටහන් ආශ්‍රිත කාරණා; සහ

(ඌ) හදිසි ආපදා සහන හා ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති සම්බන්ධ කාරණා.

(4) කාරක සභාවට ස්වකීය විෂය පථය යටතේ පවතින සියලු කරුණු සම්බන්ධයෙන් පොදු අධීක්ෂණ බලතල තිබිය යුතු අතර, එහෙත් එය පවතින නීතිවලට සීමා විය යුතු ය:

එසේ වුවද, කාරක සභාවට ස්වකීය විෂය පථය යටතේ තිබෙන කරුණුවලට අදාළ නව නීති පැනවීම සම්බන්ධයෙන් සහ පවතින නීතිවලට සංශෝධන හඳුන්වාදීම හෝ පවතින නීති අහෝසි කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට බලය ඇත්තේය.

(5) කාරක සභාව සෑම මාස තුනකට වරක් ම කාරක සභාව විසින් සොයා ගන්නා ලද කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තාවට ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග අවශ්‍ය කරන කරුණු පිළිබඳ ස්වකීය නිරීක්ෂණ සහ යම් නිර්දේශක් තිබේ නම් එම නිර්දේශ ද ඇතුළත් විය යුතුය.

(6) ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් පසු එය මූල්‍ය විෂය භාර අමාත්‍යවරයාට සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කිරීමෙන් පසු සති අටක කාලසීමාවක් ඇතුළත එහි සඳහන් නිර්දේශ සපුරාලීමටත්, නිරීක්ෂණ සම්බන්ධයෙන් අනුගමනය කිරීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් සිදු කිරීමටත්, එම අමාත්‍යවරයන් විසින් ක්‍රියා කරනු ලැබිය යුතු අතර එසේ නොමැති නම් අදාළ නිර්දේශ සපුරාලීමක් සිදු නොකළ යුතු බවට අදාළ අමාත්‍යවරයා විශ්වාස කරන්නේ නම් ලිඛිතව ඊට හේතු දක්වා එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය කවරේ ද යන්නත් සඳහන් කරනු ලැබිය යුතු ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(7) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(8) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනුකාරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(9) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(10) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙකු කාරක සභාව ඉදිරියට කැඳවීමට, ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(11) ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර අනුගාමී රැස්වීම් වාර තුනකට වඩා නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.

දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් නව ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—

118. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දස දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ කර්තව්‍ය වන්නේ—

(අ) මන්ත්‍රීවරයෙකුගේ පැවැත්ම සහ අචාර විධි සම්බන්ධව රීති කඩකිරීමට අදාළ කාරණා හෝ පාර්ලිමේන්තුවේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩකිරීම සම්බන්ධව පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිරීමක් බැලූබැල්මට පෙනෙන පරිදි වරප්‍රසාද කඩකිරීමක් බවට කථානායකවරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි පැමිණිල්ලක් විභාග කිරීම; සහ

(ආ) ඒ එක් එක් කාරණය සම්බන්ධ කාරණා ඇසුරින් පැවැත්ම සහ ආචාර විධි සම්බන්ධ රීතිවලට වරප්‍රසාද කඩකිරීමක් සිදුකර තිබේ ද යන්න නිශ්චය කිරීම සහ එවැනි කඩකිරීමක් සිදුවී තිබේ නම්, එම වරප්‍රසාද කඩ කිරීමේ ස්වභාවය, ඊට තුඩු දෙන්නා වූ අවස්ථානුගත කාරණා සහ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන කාරක සභාවේ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීම.

(3) කාරක සභාව වෙත යොමුකරනු ලබන එවැනි පැමිණිල්ලක් කාරක සභාවට ලැබුණු දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත කාරක සභාවේ නිර්දේශ කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් සුවිශේෂී කරුණු මත එකී කාලසීමාව දීර්ඝ කරන ලෙසට වන ඉල්ලීමකට අවසර ලබාදීමට කථානායකවරයාට බලය තිබිය යුත්තේ ය. කාරක සභාවට එසේ යොමු කරනු ලබන කාරණා විභාග කිරීම සඳහා අවශ්‍ය වන තැනැත්තන් කැඳවනු ලැබීමට සහ ලිපි ලේඛන සහ අනෙකුත් වාර්තා ගෙන්වා ගනු ලැබීමට ද අවශ්‍ය විය හැකි වෙනත් ක්‍රියාවන් කරනු ලැබීමට ද කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(4) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ චර්යා ධර්ම සංග්‍රහයේ රීති කඩ කිරීම හෝ පිළිනොපැදීමට අදාළව කාරක සභාවට යොමු කරනු ලබන යම් කාරණයක් පරීක්ෂා කිරීම ද කාරක සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය. පාර්ලිමේන්තුවේ අධිකාරය මත හෝ ඒ යටතේ කරනු ලබන එවැනි විභාග කිරීමක දී එහි සියලු අදියරවල දී සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් ම සහයෝගය දක්වනු ලැබිය යුත්තේ ය. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ යම් සාමාජික මන්ත්‍රීවරයකුට චර්යා ධර්ම සංග්‍රහයේ කඩ කරන ලදැයි කියනු ලබන රීති පිළිබඳව කාරක සභාව විසින් සලකා බලනු ලැබීමේ දී, ඒ සඳහා බලපෑම් කිරීමේ අදහසින් කිසිම මන්ත්‍රීවරයකු පෙළඹවීමක් සිදු කරනු නොලැබිය යුත්තේ ය.

(5) කාරක සභාව විසින් සිය කර්තව්‍යය ඉටු කරනු ලැබීමේ දී, කාරක සභාවට විශේෂඥයන්ගේ සේවය ලබා ගැනීමට සහ සාක්ෂිකරුවන් කැඳවා පරීක්ෂා කරනු ලැබීමට හැකි ය.

(6) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් පිළියෙල කරනු ලබන සිය වාර්තාවේ තිබෙන නිගමනයන් සහ නිර්දේශ පිළිබඳව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය හැකි අතර, අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී අදාළ මන්ත්‍රීවරයාට දඬුවම් පමුණුවනු ලැබිය හැකි ය.

(7) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින්, කලින් කලට, සිය කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

(8) මන්ත්‍රීවරයන්ගේ ආචාර ධර්ම සහ වෙනත් විෂමාචාර පිළිබඳ සිද්ධි විභාග කිරීමට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යැයි ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විසින් සලකනු ලැබිය හැකි යම් නියෝග නිකුත් කරනු ලැබිය හැකි ය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

''පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්,— ඉහත පරිදි ඇතුළත් කරන ලද පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 123 ට ඉක්බිතිවම අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 124 නව ස්ථාවර නියෝගය ඇතුළත් කිරීමට:—

''ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව

124. (1) රටේ ආර්ථික ස්ථායීබව ශක්තිමත් කිරීමේ දී රජයට අමතර ආදායම් රැස් කිරීම සඳහාත්, රජයේ වියදම් සලකා බැලීම සඳහාත්, ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම පිණිස තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත වන ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) රජය වෙනුවෙන් බදුකරණය, තීරු ගාස්තු හා අනෙකුත් ආදායම් වර්ධනය කිරීම සම්බන්ධ සියලුම කරුණු පරීක්ෂා කර බැලීමටත්, අවශ්‍ය පරිදි හා අවශ්‍ය අවස්ථාවන්හිදී බදු හා තීරු ගාස්තු පිළිබඳව පවත්නා ප්‍රතිපත්තිවලට වෙනස්කම් යෝජනා කිරීමටත්, මෙම කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(3) ස්වකීය රාජකාරි ඉටුකිරීමෙහිලා කාරක සභාව මතු සඳහන් කරුණු පිළිබඳව විමර්ශනය කර නිර්දේශ ඉදිරිපත් කළ යුත්තේ ය:—

(අ) සඵලදායී ආදායම් රැස්කිරීමේ යාන්ත්‍රණ;

(ආ) දේශීය ආදායම් නීති සම්බන්ධ හා වෙනත් නීතිවල නියම කරනු ලැබ ඇති ආදායම් ක්‍රියාමාර්ග සම්බන්ධ කාරණා;

(ඇ) තීරු ගාස්තු, රේගු නීති සහ ආනයනවලට හා අපනයනවලට අදාළ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ ද ඇතුළත් වන, රේගුව හා රේගු පරිපාලනය ආශ්‍රිත කාරණා;

(ඈ) සියලුම ආකාරයේ වෙළඳ ගිවිසුම්, වෙළඳ භාණ්ඩ ගිවිසුම් හා ඒවා ක්‍රියාත්මක කරනු ලබන ආකාරය මෙන්ම එම ගිවිසුම්වල ජාත්‍යන්තර රීති හා පිළිගත් ලක්ෂණ ඇතුළු අන්තර් ජාතික වෙළඳාම ආශ්‍රිත කාරණා;

(ඉ) ආනයන කර්මාන්තයේ බලපෑම්, ආනයන ප්‍රතිපත්ති, තරගකාරී ආනයන වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රණයන් සහ හානිකර හා අසාධාරණ ආනයන හා එබඳු

ආනයන පිළිවෙත් ආමන්ත්‍රණය කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළු ආනයන කර්මාන්තය ආශ්‍රිත කාරණා;

(ඊ) අපනයන ප්‍රතිපත්ති, අපනයන ප්‍රවර්ධන යාන්ත්‍රණ, වෙළඳපොළ ප්‍රවිෂ්ටය හා තරගකාරිත්වය, කර්මාන්තවලට අවශ්‍ය ද්‍රව්‍යවල අඛණ්ඩ සැපයුම, ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික වෙළඳ සබඳතා ඇතුළු වෙළඳ කර්මාන්තය ආශ්‍රිත විශේෂිත කාරණා;

(උ) සියලුම රජයේ විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය-උපස්ථානය, සුභසාධනය හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම, ඒවායේ ගෙවීම් හා ප්‍රතිපත්ති, රජයේ ළමා ආරක්ෂණ වැඩසටහන්, ශාරීරික හෝ මානසික ආබාධිතතා සහිත තැනැත්තන් සඳහා වන වැඩසටහන් සහ පුනරුත්ථාපන වැඩසටහන් ඇතුළු රජයේ සමාජ සේවා වැඩසටහන් ආශ්‍රිත කාරණා; සහ

(ඌ) හදිසි ආපදා සහන හා ඒ ආශ්‍රිත ප්‍රතිපත්ති සම්බන්ධ කාරණා.

(4) කාරක සභාවට ස්වකීය විෂය පථය යටතේ පවතින සියලු කරුණු සම්බන්ධයෙන් පොදු අධීක්ෂණ බලතල තිබිය යුතු අතර, එහෙත් එය පවතින නීතිවලට සීමා විය යුතු ය:

එසේ වුවද, කාරක සභාවට ස්වකීය විෂය පථය යටතේ තිබෙන කරුණුවලට අදාළ නව නීති පැනවීම සම්බන්ධයෙන් සහ පවතින නීතිවලට සංශෝධන හඳුන්වාදීම හෝ පවතින නීති අහෝසි කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට බලය ඇත්තේය.

(5) කාරක සභාව සෑම මාස තුනකට වරක් ම කාරක සභාව විසින් සොයා ගන්නා ලද කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තාවට ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග අවශ්‍ය කරන කරුණු පිළිබඳ ස්වකීය නිරීක්ෂණ සහ යම් නිර්දේශක් තිබේ නම් එම නිර්දේශ ද ඇතුළත් විය යුතුය.

(6) ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් පසු එය මුල්‍ය විෂය භාර අමාත්‍යවරයාට සහ අදාළ ආයතන භාර අමාත්‍යවරයන් වෙත යොමු කිරීමෙන් පසු සති අටක කාලසීමාවක් ඇතුළත එහි සඳහන් නිර්දේශ සපුරාලීමටත්, නිරීක්ෂණ සම්බන්ධයෙන් අනුගමනය කිරීමට යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් සිදු කිරීමටත්, එම අමාත්‍යවරයන් විසින් ක්‍රියා කරනු ලැබිය යුතු අතර එසේ නොමැති නම් අදාළ නිර්දේශ සපුරාලීමක් සිදු නොකළ යුතු බවට අදාළ අමාත්‍යවරයා විශ්වාස කරන්නේ නම් ලිඛිතව ඊට හේතු දක්වා එම අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලබන විකල්ප ක්‍රියාමාර්ගය කවරේ ද යන්නත් සඳහන් කරනු ලැබිය යුතු ය. කාරක සභාවට අවශ්‍ය වන්නේ නම්, අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට ආරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්නවලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය.

(7) කාරක සභාවට අවශ්‍ය යැයි හැඟීයන්නේ නම් ඕනෑම ආයතනයක් පිළිබඳ සොයා බැලීම සඳහා එම කාරක සභා සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සැදුම්ලත් අනු කාරක සභා පත් කරනු ලැබිය හැකි අතර, කාරක සභාවේ අනෙකුත් සාමාජික මන්ත්‍රීවරයන් ද එකී කවර හෝ අනු කාරක සභා රැස්වීමකට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයන්ට ද ඊට සහභාගී විය හැකි ය. එකී අනු කාරක සභා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම කරුණක් පිළිබඳව කාරක සභාව වෙත වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

(8) අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී, කාරක සභාවට හෝ කාරක සභාව විසින් පත් කරන ලද එවැනි ඕනෑම අනුකාරක සභාවකට, කාරක සභාව විසින් තීරණය කරනු ලබන

පරිදි පාර්ලිමේන්තු සංකීර්ණය තුළ දී හෝ අදාළ ඕනෑම ආයතනයක දී රැස්වීම් පවත්වනු ලැබිය හැකි ය.

(9) කාරක සභා සභාපතිවරයාගේ අවසරය මත කාරක සභා සාමාජික මන්ත්‍රීවරයෙකු නොවන වෙනත් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කාරක සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දිය හැකි ය.

(10) කාරක සභාව විසින් ස්වකීය වගකීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ඕනෑම පුද්ගලයෙකු කාරක සභාව ඉදිරියට කැඳවීමට, ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කිරීමට සහ ඕනෑම ලිපි ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් පිළිබඳ විභාග කිරීමටත්, ගබඩා සහ දේපළ විමර්ශනය කිරීමටත්, ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවට හෝ එහි ඕනෑම අනු කාරක සභාවකට බලය ලැබිය යුත්තේ ය.

(11) ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් සංයුක්ත විය යුත්තේ ය. යම් සාමාජික මන්ත්‍රීවරයෙකු කාරක සභාවට පිළිගත හැකි හේතුවක් සඳහන් නොකර අනුගාමී රැස්වීම් වාර තුනකට වඩා නොපැමිණෙන්නේ නම්, එම සාමාජික මන්ත්‍රීවරයා කාරක සභා සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලැබිය යුත්තේ ය.''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''නව ස්ථාවර නියෝගය, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට ඇතුළත් කළ යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්,— පාර්ලිමේන්තුවේ දැනට පවතින ස්ථාවර නියෝග 118 ඉවත් කර ඒ වෙනුවට අද දින න්‍යාය පත්‍රයේ සඳහන් ස්ථාවර නියෝගය ආදේශ කිරීමට:—

"118. (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දස දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ කර්තව්‍ය වන්නේ—

(අ) මන්ත්‍රීවරයෙකුගේ පැවැත්ම සහ අචාර විධි සම්බන්ධව රීති කඩකිරීමට අදාළ කාරණා හෝ පාර්ලිමේන්තුවේ හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද කඩකිරීම සම්බන්ධව පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිරීමක් බැලූබැල්මට පෙනෙන පරිදි වරප්‍රසාද කඩකිරීමක් බවට කථානායකවරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි පැමිණිල්ලක් විභාග කිරීම; සහ

(ආ) ඒ එක් එක් කාරණය සම්බන්ධ කාරණා ඇසුරින් පැවැත්ම සහ ආචාර විධි සම්බන්ධ රීතිවලට වරප්‍රසාද කඩකිරීමක් සිදුකර තිබේ ද යන්න නිශ්චය කිරීම සහ එවැනි කඩකිරීමක් සිදුවී තිබේ නම්, එම වරප්‍රසාද කඩ කිරීමේ ස්වභාවය, ඊට තුඩු දෙන්නා වූ අවස්ථානුගත කාරණා සහ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන කාරක සභාවේ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීම.

(3) කාරක සභාව වෙත යොමුකරනු ලබන එවැනි පැමිණිල්ලක් කාරක සභාවට ලැබුණු දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත කාරක සභාවේ නිර්දේශ කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් සුවිශේෂී කරුණු මත එකී කාලසීමාව දීර්ඝ කරන ලෙසට වන ඉල්ලීමකට අවසර ලබාදීමට කථානායකවරයාට බලය තිබිය යුත්තේ ය. කාරක සභාවට එසේ යොමු කරනු ලබන කාරණා විභාග කිරීම සඳහා අවශ්‍ය වන තැනැත්තන් කැඳවනු ලැබීමට සහ ලිපි ලේඛන සහ අනෙකුත් වාර්තා ගෙන්වා ගනු ලැබීමට ද අවශ්‍ය විය හැකි වෙනත් ක්‍රියාවන් කරනු ලැබීමට ද කාරක සභාවට බලය තිබිය යුත්තේ ය.

(4) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ චර්යා ධර්ම සංග්‍රහයේ රීති කඩ කිරීම හෝ පිළිනොපැදීමට අදාළව කාරක සභාවට යොමු කරනු ලබන යම් කාරණයක් පරීක්ෂා කිරීම ද කාරක සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය. පාර්ලිමේන්තුවේ අධිකාරය මත හෝ ඒ යටතේ කරනු ලබන එවැනි විභාග කිරීමක දී එහි සියලු අදියරවල දී සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් ම සහයෝගය දක්වනු ලැබිය යුත්තේ ය. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ යම් සාමාජික මන්ත්‍රීවරයකුට චර්යා ධර්ම සංග්‍රහයේ කඩ කරන ලදැයි කියනු ලබන රීති පිළිබඳව කාරක සභාව විසින් සලකා බලනු ලැබීමේ දී, ඒ සඳහා බලපෑම් කිරීමේ අදහසින් කිසිම මන්ත්‍රීවරයකු පෙළඹවීමක් සිදු කරනු නොලැබිය යුත්තේ ය.

(5) කාරක සභාව විසින් සිය කර්තව්‍යය ඉටු කරනු ලැබීමේ දී, කාරක සභාවට විශේෂඥයන්ගේ සේවය ලබා ගැනීමට සහ සාක්ෂිකරුවන් කැඳවා පරීක්ෂා කරනු ලැබීමට හැකි ය.

(6) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් පිළියෙල කරනු ලබන සිය වාර්තාවේ තිබෙන නිගමනයන් සහ නිර්දේශ පිළිබඳව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය හැකි අතර, අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක දී අදාළ මන්ත්‍රීවරයාට දඬුවම් පමුණුවනු ලැබිය හැකි ය.

(7) ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින්, කලින් කලට, සිය කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

(8) මන්ත්‍රීවරයන්ගේ ආචාර ධර්ම සහ වෙනත් විෂමාචාර පිළිබඳ සිද්ධි විභාග කිරීමට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි යැයි ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විසින් සලකනු ලැබිය හැකි යම් නියෝග නිකුත් කරනු ලැබිය හැකි ය.''

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''ස්ථාවර නියෝග 118 සංශෝධිතාකාරයෙන්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තුව යළි එක්රැස් විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124 සහ 118 කාරක සභාවේදී සලකා බලා සංශෝධන සහිතව සම්මත කරන ලද බව වාර්තා කරන ලදී.

පාර්ලිමේන්තුවේ සංශෝධිත ස්ථාවර නියෝගයන්හි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට අවසර දෙන ලෙස පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10. කල් තැබීම : "මෙම පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය; අ.භා. 6.42 ට නියෝජ්‍ය කථානායකවරයා විසින් 2022 නොවැම්බර් 19 සභා සම්මතිය අනුව 2022 නොවැම්බර් 24 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.